සම්මානය ලැබුණ 'හීමභූමි' නාට්‍යයේ තුග්ලග්ගේ භූමිකාව, ධවල හිඟන නාට්‍යයේ සොල්දාදුවාගේ භූමිකාව, සෝමලතා සුබසිංහගේ 'ඇන්ටිගනී' නාට්‍යයේ ක්‍රියෝන්ගේ භූමිකාව, මෙහෙම භූමිකා ගණනාවක් තියනවා. ඒ නිසා එකකට ඇඟිල්ල දික්කරන්න අමාරුයි මෙන්න මේක තමයි මගේ සිත්ගත්තේ කියලා. මා වේදිකාවේ නිරූපනය කළ භූමිකා එකකට එකක් වෙනස්. ඒ නිසා මම වේදිකාවේ නිරූපනය කළ හැම චරිතයකටම ඉතා ලෙන්ගතුව ආදරේ කරනවා.

අද වෙනකොට ඔබ වේදිකාවේ පමණක් නෙවෙයි රූපවාහිනිය සහ සිනමාවේද නම රැන්දූ රංගන ශිල්පියෙක්. මේ අතරින් ඔබ වඩාත් කැමති වේදිකා රංගනය වනවාට සැකයක් නැහැ. කොහොමද ඔබ වේදිකා නාට්‍ය රංගනයට පිවිසුණේ?

මම ජීවිතයේ පළමු වතාවට වේදිකා නාට්‍යයක් නැරඹුවේ උසස් පෙළ විභාගයට පෙනී ඉඳලා ප්‍රතිපල අපේක්ෂාවෙන් ඉන්න කාලයේදී. පානදුර පුරහළේදී වේදිකාගත වුණ ධර්මසිරි බණ්ඩාරනායකගේ ඒකාධිපති තමයි ඒ නාට්‍ය. මේ නාට්‍ය බලනකොට මා තුළ ඇතිවූ වමත්කාරය, එහි තිබූ අපූර්වත්වය, එහි තිබූ ජවසම්පන්නබව මාව කම්පනයකට ලක්කළා. ඊට පස්සේ තමයි මම මේ අපූරු මාධ්‍යයට පිවිසෙන්නේ කොහොමද කියන එක හොයාබලන්න පටන්ගත්තේ. එතකොට තමයි මට ආචාර්ය ගාමිනී හත්තොටුව නාට්‍ය ශිල්පීන්ට වැඩමුළුවකට ආරාධනය කරලා තියන අවස්ථාවක් දකින්න ලැබුණේ. මමත් ඒකට ඉල්ලුම්කරලා එයට සම්බන්ධ වුණා. අවුරුද්දක කාලයක් තිබුණ ඒ වැඩමුළුවෙන් පස්සේ ඔහුගේ විවෘත වීදි නාට්‍ය කණ්ඩායමට මාව සම්බන්ධ කරගත්තා. වීදි නාට්‍ය කණ්ඩායමෙන් මම කාලයක් වැඩකළා. ඊට පස්සේ තමයි මට වේදිකාවේ ශිල්පීන්ව හඳුනාගන්න අවස්ථාව ලැබුණේ. ඊට පස්සේ මට අවස්ථාව ලැබුණා තරුණ සහ ප්‍රවීණ නිර්මාණකරුවන් ගණනාවකගේ වේදිකා නාට්‍යවලට සම්බන්ධ වෙන්න. ඔවුන් මගේ මොකක් හරි දක්ෂතාවයක් දැකලා මාව ඒ විදිහට තෝරාගන්න ඇති කියලා මම හිතනවා. ධර්මසිරි බණ්ඩාරනායක, අශෝක හඳගම, සෝමලතා සුබසිංහ, අතුල පීරිස්, ජයලත් මනෝරත්න, සුනිල් චන්ද්‍රසිරි, බන්දුල විතානගේ වගේ ප්‍රවීණ නාට්‍යකරුවන් ඔවුන්ගේ යම් යම් නිර්මාණවලට මාව සම්බන්ධ කරගත්තා. ඒ තුළ මට ලොකු උත්තේජනයක් ලැබුණා. අපේ රටවල ආයතන පද්ධතියක් නෑනේ ඇකඩමික් තලයට පත්වෙන්න. ඉතිං ස්වයං අධ්‍යයනයක් තුළ තමයි අපිට වැඩෙන්න වෙන්නේ. ලැබෙන අවස්ථාවන් තුළින් ඒ අධ්‍යාපනය ලබමින්, මම කිසිම කල්ලි කණ්ඩායමකට අයත් නොවී ස්වාධීනව වැඩකළා. අද මෙනවා හරි පුංචි දොයක් හරි මට ලැබිලා තියනවා නම් මට ඒක ලොකු ශක්තියක් වුණා කියලයි මම හිතන්නේ.

දක්ෂ නළුවන් පසු කාලයේ දක්ෂ අධ්‍යක්ෂවරුන් බවට පත්වෙන අවස්ථා ඔබේ ක්ෂේත්‍රයේ තියනවා. ඔබ රංගනයෙන් ඔබ්බට යමින් නිර්මාණ කාර්යයකට යොමුවෙන්න අදහසක් නැත්ද?

මම 2009 දී මගේ නිර්මාණයක් කළා 'සුළඟ මට කතාකරයි' කියලා. එයට රාජ්‍ය නාට්‍ය උළෙලේ ඇගයීම් ගණනාවක් ලැබුණා. දැන් තවත් නාට්‍යයක් අධ්‍යක්ෂණය කිරීම සඳහා පිළුරුපත් සකස්කරමින් තියනවා. ප්‍රශ්නේ තියෙන්නේ නිෂ්පාදකවරයෙක් සොයාගැනීම. කොහොම නමුත් මගේ දැඩි ආශාව තියෙන්නේ වේදිකාවට. එහි තියන ජවසම්පන්න බව වෙනත් කිසිම මාධ්‍යයක නැහැ කියලයි මට හිතෙන්නේ. අද ලෝකයේ වේදිකාව කියන්නේ සිනමාව තුළත් කරන්න බැරි දේවල් කරන තැනක් බවට පත්වෙලා තියනවා. ඒ නිසා තමයි වසර ගණනාවක් එකම රඟහලේ එකම නාට්‍ය නැවත නැවත වේදිකාගත වෙන්නේ. ඒ වගේ තත්ත්වයක් ලංකාවේ දකින්න නැහැ. නමුත් මේ තියන අඩුපහසුකම් යටතේ අපි වැඩකරගෙන යනවා. මේක තුළ හිමිවන ජවය, පන්නරය, විනය තමයි අපි අනෙක් මාධ්‍යයටත් ගෙනියන්නේ.

ඔබ රංගන ශිල්පියෙකු ලෙස විවිධ නිෂ්පාදකවරුන් සහ අධ්‍යක්ෂවරුන් සමඟ කටයුතු කර තියනවා. ඔවුන් අතරින් ඔබගේ මතකයේ රැඳුණු සුවිශේෂී පුද්ගලයන් සහ ඔබ දුටු ඔවුන්ගේ සුවිශේෂිතා ගැන යමක් කිව හැකිද?

මෙහෙමයි. අපි පුද්ගලයෝ දහ දෙනෙක් ගත්තොත් ඔවුන්ගේ චර්යාවන් විවිධයි. අදහස් විවිධයි. අරමුණු විවිධයි. සිතුම් පැතුම් විවිධයි. ඒ විදිහටම තමයි අපිට මුණගැසෙන නිර්මාණකරුවනුත්. ඒ නිර්මාණකරුවන්ගේ ශක්‍යතාවයත් විවිධයි. ඒ නිසා විවිධ අය සමඟ ඇසුරු කිරීම, ඔවුන්ගේ දැනුම ලබාගැනීම සහ ඔවුන්ගේ නිර්මාන තුළ වැඩකරන්න ලැබීමත් ලොකු භාග්‍යයක් කියලයි මම හිතන්නේ. වේදිකාවේ වර්තමාන තරුණ නාට්‍යකරුවන් අතර අතුල පතිරණ, රාජිත දිසානායක වගේ අය ගත්තොත් ඔවුන් ඉතාමත් ඉහළ මට්ටමෙන් ඔවුන්ගේ ශක්‍යතාවන් ප්‍රදර්ශනය කරලා තියනවා. නමුත් මම වැඩකළ අද දවසේ ප්‍රවීණයැයි කියන නිර්මාණකරුවන් අතරින් මම විශේෂ තැනක ළා සළකන්නේ ධර්මසිරි බණ්ඩාරනායකව. මොකද ඔහුගේ නිර්මාණයකට ඔහු දෙන දායකත්වය සහ ඔහුගේ ශිල්පියෙකුට ඔහු විසින් දෙන ජවය අති ප්‍රභලයි. මම හිතන්නේ ඒක ඔහුත් රංගධරයෙක්වීම සහ ඔහු ඔහුගේ නිර්මාණයට මොනතරම් කැපවෙනවාද කියන කාරණය මත තමයි එය තියෙන්නේ. ඔහු නිර්මාණයක් කරනකොට ශිල්පියෙකුගේ ඇඳුමේ තියන බොත්තම ගැන පවා සළකිලිමත් වෙනවා. බොත්ත මක්වත් වෙනස් වූ තැනක ඔහු රඳවන්නේ නෑ. එච්චරම ඒ ටු ඉසෙඩ් හැම දෙයක්ම ඇකියුරේට් ඔහුට අවශ්‍ය කරනවා. ඒක තමයි මම ඔහුගෙන් දැක්ක ප්‍රධානම ගුණාංගය. ඔහු කිසිම මොහොතක තමන්ගේ නිර්මාණය අතහරින්නේ නෑ. ඒ කියන්නේ අපි දන්නවනේ මේ වගේ රටක නිර්මාණයක් කරනකොට නිර්මාණකරුවා මොන තරම් ප්‍රශ්න ගණනකට මුහුණ දෙනවද කියලා. එතකොට අවසාන භාගයට යනකොට දැඩි වෙහෙසකට සහ මහා කාලකණ්ති භාවයකට පත්වෙනවා. මොකද නුදකලාවේ තමයි මේ සියල්ල කරන්න වෙන්නේ. එහෙම වුණත් ඔහු ඒක අතාරින්නේ නෑ. ඒ ඔහුගේ මා දුටු විශේෂත්වයන්. ඒ නිසා මට කියන්න පුළුවන් මම වැඩකළ ප්‍රවීණයන් සියල්ල අතරින් ධර්මසිරි බණ්ඩාරනායක ඉතාම ඉහළ තැනක ඉන්නවා කියලා.

ඔබ චරිතාංග නළුවෙකු ලෙස බොහෝ ඉදිරියෙන් සිටින රංගන ශිල්පියෙක්. නමුත් ඔබ ඇතැම් චරිත නිරූපනයේදී ඒ චරිතය යටපත් කරගෙන ජනක කුමුදුගේ කියන පුද්ගලයාගේ පෞර්ෂ ලක්ෂණ මතුවෙන බවක් පෙනෙනවා. එය එක්තරා ආකාරයකට හෙළ සිනමාවේ සක්විති ගාමිණී ෆොන්සේකා තුළින් දිස්වුණු ලක්ෂණයක් විදිහට කිව්වොත් මම වැරදි නැහැ කියලා හිතනවා. ගාමිණී ෆොන්සේකා කුමන චරිතයක් නිරූපනය කළත් එය ගාමිණී ෆොන්සේකාගේ රඟපෑමක් විදිහට මතුවෙන අවස්ථා හමුවෙනවා. නමුත් ජෝ අබේවික්‍රමගේ රඟපෑම්වලදී දකින්නට ලැබෙන්නේ ජෝ අබේවික්‍රම වාෂ්පවෙලා ගිහින් ඔහු නිරූපනය කරන චරිතය පමණක් මතුවී පෙනෙනවා. මේ කාරණය ඔබට දැනෙන්නේ කොහොමද?

මම වගේ කෙනෙක් එක්ක ගාමිණී ෆොන්සේකා මගන්තයා උදාහරණයකට ගත්ත එක සම්පූර්ණයෙන් වැරදියි කියලයි මම හිතන්නේ. ඒක එතුමාට කරන අගෞරවයක්. ඔබ කරන යෝජනාවත් මම පිළිගන්නේ නෑ. මිස්ට ෆොන්සේකාගේ භූමිකාවන් ඇතුළේ ඔහුගේ පෞර්ෂය ගොඩනැගුනා වගේම ඔහු විසින් පරසතු මල්, සරුංගලය, නිධානය වගේ චිත්‍රපටිවල නිරූපනය කළ දැවැන්ත චරිත රට පවතිනකම් පවතිනවා. ජෝ අබේවික්‍රම මගන්තයා ගන්නත් එහෙමයි. ඔහු විසින් නිරූපනය කළ සමහර භූමිකා අතිශය ප්‍රභල තැනෙක තියනවා. මොන විදිහෙන් බැලුවත් මේ දෙදෙනාම සිංහල සිනමාවේ අති විශිෂ්ඨයන්. එදා සිනමාවට හිමිවෙලා තිබුණ තැන අද රූපවාහිනියට හිමිවෙලා තියෙන්නේ. රටේ නාට්‍ය නිර්මාණය වන ආකාරය අනුව රංග පෞර්ෂයන් බිහිවීමේ කිසිම ඉඩක් ඒ තුළ නෑ. ඒ නිසා හැම චරිතයක්ම ඒකාකාරි ස්වාභාවයක තමයි තියෙන්නේ. ඒ නිසාම අපි උත්සාහ කරන්නේ ලැබෙන දෙයින් කොහොම හරි අපේ වසසරිය හදාගන්න. ඒ හදාගන්න යාමේදී ඔබ ඔය කියන පෞර්ෂය මතුවෙනවා වෙන්න පුළුවන්. ඒ හරි ඔබේ ප්‍රශ්නයට මට පැහැදිලි පිළිතුරක් දෙන්න අමාරුයි.

මේ වෙනකොට ඔබ වේදිකාවට වඩා සමීප ගනුදෙනුවක නිරත වෙන්නේ රූපවාහිනියත් සමඟ. රෙලි නාට්‍ය නළුවෙක් විදිහට රෙලි නාට්‍ය සහ ඒවායේ රංගනයන් ගැන ඔබට මොකද හිතෙන්නේ?

වර්තමාන රෙලි නාට්‍ය කලාව ගත්තොත් ඒවායේ චරිත මතුවෙන්නේ නෑ. නිවැරදිව දෙබස් නිර්මාණය වෙන්නේ නෑ. බොරු වචන ටිකක් කියවනවා. ජීවිතය විවරණය කරන රෙලි නාට්‍ය පිටපත් අවුරුද්දකට දෙකකට එකක් හැරෙන්න එන්නෙම නැති තරම්. වර්ථමාන රෙලි නාට්‍ය කර්මාන්තය ඇතුළේ හොඳ පිටපත් රචකයන්ට රැදෙන්න බෑ. ඒ නිසා රූපවාහිනිය ඇතුළේ සාර්ථක රංගනයන් ගැන දැන් කතා කරන්න බෑ. රංග කාර්යය ගැන කතාකරනවා නම් ඒක කරන්න තියෙන්නේ වේදිකාවේ හෝ සිනමාවේ විතරයි කියලයි මට හිතෙන්නේ. අපි මේ ක්ෂේත්‍රයට එනකොට තිබුණ ස්වාභාවයත් අද වෙනකොට සම්පූර්ණයෙන්ම වීනාශවෙලා ඉවරයි. හේදිලා ගිහිල්ලා. ඒ නිසා මේවායේ චරිත මතුවෙන්නේ නෑ. අද දවසේ බිහිවෙන ශිල්පීන් රූපය හරහා එහෙට මෙහෙට ස්ක්‍රීන් එක

'ආදර්ශනීය සංවාදයක් නාට්‍යයේ ජනක කුමුදුගේ සහ සාරංග දිසානායක

ඇතුළේ වැනෙනවා මිසක් ඔවුන්ට චරිත නිරූපනයන්ට අවස්ථාවක් නෑ.

රෙලි නාට්‍ය පහක් ගත්තොත් පහේම තියෙන්නේ එකම වර්ගයේ චරිත. එකම දෙබස්. එකම ලොකේෂන්. එකම වාහන. ඉතිං කොහොමද චරිත නිර්මාණය වෙන්නේ. ඉතිං ඒක මේ රටේ අවාසනාවන්ත ස්වාභාවයක්. රෙලි නාට්‍ය කර්මාන්තය ලාභය පමණක් පෙරදැරි කරගෙන වැඩකරනවා ඇරෙන්න මට නම් පේන්නේ නෑ හොඳ නිර්මාණයක් සඳහා කිසිවෙක් වෙහෙස වෙන බවක්. එහෙම වෙහෙසක් දැරුව නිර්මාණකරුවන් කිප දෙනෙක් ඉන්නවා. නමුත් ඒ අයට ඒවා විකුණාගන්න නොහැකි වෙලයි තියෙන්නේ.

දක්ෂ චරිතාංග නළුවෙකු විදිහට වේදිකාවේ සහ රූපවාහිනියේ ඔබට හිමිවූ අවස්ථා සිනමාවේදි හිමිවුණ බවක් පෙනෙන්නට නැහැ. සිංහල සිනමාව බිඳවැටීමට දක්ෂ නළු කිළියන් නැතිකමත් එක් හේතුවක්. එවැනි පසුබිමක ඔබට හිතෙන හැටියට සිනමාව තුළ ඔබට ප්‍රමාණවත් ඉඩක් අහිමිවීමට මොන වගේ හේතුද බලපාලා තියෙන්නේ?

ඔබගේ කියන කාරණය සම්පූර්ණ සත්‍යයක්. අද දවසේ මමත් කල්පනා කරන්නේ ඇයි එහෙම වුණේ කියලා. ඒකට හේතුව මොකක්ද කියන එක සම්බන්ධයෙන් පැහැදිලි පිළිතුරක් මා සතුව නැහැද. මම කවදාවත් නිර්මාණකරුවන් පස්සේ ගිහිල්ලා චරිත ඉල්ලලා නැහැ. ඔවුන් එක්ක ලොකුවට සමිති

දහසය වන පිටට

GATEWAY
LAWYERS

▶ Advice on Legal Matters
▶ Business & Commercial Law
▶ Sale of Business
▶ Conveyancing
▶ Powers of Attorney
▶ Wills & Estate Planning
▶ Migration Law

Senanie Kurukularatne LL.B
Barrister & Solicitor
Attorney-at-Law Sri Lanka
Registered Migration Agent
MARN 0854193

T 03 8786 9682
F 03 8786 9681
M 0414 660 513
gateway5@bigpond.net.au
DX 30463 Berwick VIC 3806
PO Box 730 Berwick VIC 3806
17 Glenview Rise Berwick VIC 3806 Australia